# මත්ලෝලීන් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමට බලපාන සාධක සහ ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා අධ්‍යයනය

ආර්.බී.අයි.වී. රත්නමළල[1]

***අභිමතාර්ථය 03***: සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ සියලු වයස්වල සැමට යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම

## 1. හැඳින්වීම

සමාජයක පවතින සම්මතයන් උල්ලංඝනය කිරීමක්, නොතකා හැරීමක් හෝ ඉක්මවා යාමක් සමාජ සදාචාරය ව්‍යාකූල වීමකි. එවන් එක් අර්බුදකාරී සමාජ ප්‍රවේශයක් ලෙස මත්ද්‍රව්‍ය හැඳින්විය හැකිය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (NDDCB) සඳහන් කරන පරිදි, වසංගතමය තත්ත්වයක් දක්වා වර්ධනය වූ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි, මත්ද්‍රව්‍ය ආශ්‍රිත නූතන ප්‍රවණතා සහ ඒ ආශ්‍රිත උපනතීන් සෘජුවම බලපෑම් කරනු ලබයි (NDDCB, 2016). මත්ද්‍රව්‍ය සමාජගත වීමේ විවිධ පැතිකඩයන් බොහෝ පර්යේෂණ වාර්තා තුළින් හෙළි කළද, පුද්ගලයෙක් ඊට යොමුවීමට බලපාන හේතු සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමේ විශාල අඩුවක් දක්නට ලැබේ. මත්ද්‍රව්‍ය සමාජගත වීමට බලපාන සාධක කෙරෙහි අවධානය යොමු කිරීම, ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිදුවන අපචාර ක්‍රියාවන් වැළැක්වීමට නිසැක පිටිවහලක් වනු ඇත.

එක්සත් ජාතීන්ගේ අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ සංවිධානය (UNODC) සඳහන් කරන පරිදි 2020 වසර තුළ ලොව පුරා මිලියන 275ක ජනතාවක් මත්ද්‍රව්‍ය භාවිත කර ඇති අතර, මිලියන 36කට අධික පිරිසක් මත්ද්‍රව්‍ය භාවිත ආබාධවලින් පීඩා විඳිති (UNODC, 2021). ලෝකයේ වැඩි දෙනෙක් භාවිතා කරන මත්ද්‍රව්‍යය ගංජා වන අතර, එය ප්‍රමාණාත්මකව මිලියන 200කි (Elflein, 2021). NDDCB (2020) අනුව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 2018 වර්ෂය හා සසඳන කළ, 10%ක අඩුවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් 55%ක බහුතරය බස්නාහිර පළාතෙන් වාර්තා වී ඇත. 2019 වර්ෂයේදී මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාවෙහි ප්‍රවණතාවය වයස අවුරුදු 15 - 64 අතර ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට පුද්ගලයන් 439 දෙනෙකි (NDDCB, 2020).

මතින් නිදහස් රටක් සඳහා වූ ඉදිරි දැක්ම යාවත්කාලීන කිරීම උදෙසාත්, ගෝලීය වශයෙන් මානව වර්ගයාගේ ප්‍රගමනයට හිතකර ජීවන වටපිටාවක් බිහි කිරීමෙහි ලා උපයුක්ත කොට ගන්නා තිරසාර සංවර්ධන ඉලක්ක අතරින් තෙවැන්න වන සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ මානව

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
vish123rathnamalala@gmail.com

යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම යටතේ, පස්වැනි උප ඉලක්කය වන මත්ද්‍රව්‍ය හා මත්පැන් අනිසි භාවිතය වැළැක්වීමත්, ඊට අනුබද්ධිත ප්‍රතිකාර ක්‍රියාවලිය ශක්තිමත් කිරීමත් සඳහා සමාජ පර්යේෂණ ක්ෂේත්‍රය ඔස්සේ ඉටුකළ හැකි වගකීම පුළුල් පරාසයක් තුළ විහිදී පවතී. ඒ සඳහා වන මූලික අඩිතාලමක් ලෙස මත්ලෝලීන් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමට බලපාන සාධක සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා හඳුනා ගැනීම වැදගත් වනු ඇත.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

මෙම කාලීන සමාජ ගැටලුව මත පදනම්ව, ශ්‍රී ලංකාව තුළ මත්ලෝලීන් මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමට බලපාන සාධක සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා හඳුනා ගැනීම යථෝක්ත පර්යේෂණයේ අරමුණ වශයෙන් යොදා ගන්නා ලදී.

ඒ අනුව 2011 - 2020 දක්වා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් ප්‍රකාශයට පත්කොට ඇති මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වීම්, බන්ධනාගාර ගතවීම් සහ පුනරුත්ථාපන ප්‍රතිකාර සඳහා යොමුවීම් යන නිර්ණායක මත පදනම්ව ද්විතියික දත්ත ඇසුරින්, ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම භාවිතා කරන ලදී. එමෙන්ම ජාතික අන්තරායකර ඖෂධ නිවාරණ අධිකාරියට අනුබද්ධිතව ක්‍රියාත්මක වන මත්ලෝලී පුනරුත්ථාපන මධ්‍යස්ථාන 4 අතුරින් සසම්භාවීව තෝරාගත් මධ්‍යස්ථාන 2ක එනම්, තලංගම, කොස්වත්තෙහි පිහිටි "සෙත්සෙවණ" සහ නිට්ටඹුව, ඌරාපොළ පිහිටි "නවදිගන්තය" යන ප්‍රතිකාර මධ්‍යස්ථාන ද්විත්වය මෙන්ම සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අවිස්සාවේල්ල, පුවක්පිටියෙහි පිහිටි "ජයවිරු සමාධි" හි, ප්‍රතිකාර ලබන රැඳවියන් 130ක පිරිස අතුරින් සරල සසම්භාවී නියැදීම යටතේ Yamane ක්‍රමවේදය මඟින් තෝරාගත් 98 දෙනෙකුගෙන් සමන්විත නියැදිය ඇසුරෙන් සංවෘත ප්‍රශ්නාවලියක් භාවිතා කොට ලබාගත් ප්‍රාථමික දත්ත භාවිතයෙන් මත්ද්‍රව්‍ය සඳහා යොමු වීමට බලපාන සාධක හඳුනාගැනීම සිදු කරන ලදී. මෙහිදී ප්‍රමුඛ සංරචක සාධක නිස්සාරණ ක්‍රමවේදය (Principle Component Factoring - PCF) යටතේ Varimax සාධක කරකැවීමේ ක්‍රමය ඔස්සේ සාධක විශ්ලේෂණය සිදුකොට ප්‍රතිඵල අර්ථ දක්වා ඇත.

## 3. දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අනුව ගංජා සහ හෙරොයින් ශ්‍රී ලංකාව තුළ ඉහළ ව්‍යාප්තියක් සහිත මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගෙන ඇත. වයස අවුරුදු 14ට වැඩි ජනගහනයෙන් 1.9%ක ප්‍රතිශතයක් ගංජා භාවිතා කරනු ලබයි. 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 2019 වර්ෂය හා සසඳන කළ, 9%ක වැඩිවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් හෙරොයින් වැරදි සඳහා

53%ක්ද, ගංජා ආශ්‍රිත වැරදි සඳහා 42%ක්ද වේ. මත්ද්‍රව්‍ය සඳහා අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරය (42%) බස්නාහිර පළාතෙන් වාර්තා වී ඇත. 2020 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාවේ ප්‍රවණතාවය වයස අවුරුදු 15 - 64 අතර ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට පුද්ගලයන් 479කි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් අතර බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය පොදු ප්‍රවණතාවක් වශයෙන් හඳුනාගත හැකිවිය.


2020 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි හේතුවෙන් බන්ධනාගාර ගත වූ මුළු පුද්ගල සංඛ්‍යාවෙන් 47%ක් මත්ද්‍රව්‍ය වැරදි සඳහා බන්ධනාගාර ගත වූවන් ය. 2017 - 2020 දක්වා වසර 4ක කාලය තුළ වාර්තාවන වැඩිම මත්ද්‍රව්‍ය සම්බන්ධ බන්ධනාගාර ගතවීම් සංඛ්‍යාව නිරූපණය කරන්නේ බස්නාහිර පළාතෙනි. බස්නාහිර පළාත තුළ 2017 සිට 2019 දක්වා ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිබූ බන්ධනාගාර ගතවීම් ප්‍රතිශතය 2019 වර්ෂයේ උපරිම අගයක් පෙන්වන අතර එය ප්‍රතිශතාත්මකව 31.17%කි. මත්ද්‍රව්‍ය සම්බන්ධ බන්ධනාගාර ගතවීම් සංඛ්‍යාවේ වර්ධනීය අවස්ථාවන් ගත් විට, 23.3%ක වර්ධනයක් උතුරු මැද පළාතෙන්ද, 19.46%ක වර්ධනයක් වයඹ පළාතෙන්ද, 19.45%ක වර්ධනයක් උතුරු පළාතෙන් ද වශයෙන් වාර්තා වේ. 2019 වර්ෂය හා සැසඳීමේ දී 2020 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාර ගතවීම් 32%කින් අඩුවී ඇත.

2011 - 2020 දක්වා වැඩි වශයෙන්ම පුනරුත්ථාපන ප්‍රතිකාර සඳහා යොමු වී ඇත්තේ බස්නාහිර පළාතෙන් වන අතර වැඩිම පුනරුත්ථාපන රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ 2018 වර්ෂයේ දී ය. 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා 11.2%ක වර්ධනයක් බස්නාහිර පළාත තුළ දැකිය හැකිය. එමෙන්ම 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී රෝගීන්ගේ 10.3%ක අඩුවීමක් වාර්තා වේ. වාර්ෂිකව බස්නාහිර පළාත තුළ ප්‍රතිකාර සඳහා ඇතුළත්වීමේ ප්‍රතිශතය අඩුවීම කෙරෙහි සෙසු පළාත්වල මත්ද්‍රව්‍ය භාවිතයෙහි සිදුව ඇති සාපේක්ෂ වර්ධනය බලපාන බව පැහැදිලිය.

ප්‍රමුඛ සංරචක සාධක නිස්සාරණ ක්‍රමය යටතේ සිදු කළ විචලතා විශ්ලේෂණයට අනුව, මූලික සංරචක 6ක් හඳුනාගත හැකි වූ අතර එම සංරචක 6 මඟින් සමස්ත සාධකවල විචලනයෙන් 62.2%ක් විස්තර විය. Varimax සාධක කරකැවීමේ ක්‍රමය අනුව ප්‍රධාන සංරචක 6ට අදාළව විචල්‍යයන් බෙදා වෙන් වූ ආකාරය අනුව මත්ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහිවීමට බාහිර සාධක, පාරිසරික සාධක, සමාජීය සාධක, මානසික සාධක, අන්තර් පුද්ගල සාධක සහ කුටුම්භ සාධක යන සංරචක මූලික වශයෙන් බලපාන බව හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ සංරචක 6ට අනුව සාධක වෙන් වූ ආකාරය සාරාංශයක් වශයෙන් රූප සටහන 1න් දක්වේ.

රූප සටහන 1: මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීමට බලපාන සාධක




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2022*

## 4. නිගමන හා යෝජනා

PCF හි Varimax ක්‍රමය යටතේ සාධක විශ්ලේෂණය සිදු කිරීමේදී බාහිර බලපෑම, පාරිසරික බලපෑම, සමාජයීය බලපෑම, මානසික බලපෑම, අන්තර් පුද්ගල බලපෑම සහ කුටුම්භ බලපෑම යන සාධක පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහි කරවීමට සමත් බවත්, සියලුම වැරදි අතුරින් මත්ද්‍රව්‍ය වැරදි ප්‍රමුඛ වන බව සහ සමස්තයක් ලෙස ගත් කළ, 2011 - 2020 දක්වා පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන්ම අත්අඩංගුවට පත්වීම්, බන්ධනාගාර ගතවීම් හා පුනරුත්ථාපන ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම් වාර්තා වන්නේ බස්නාහිර පළාත තුළ, වයස අවුරුදු 20 - 24 අතර, සිංහල ජාතික, පුරුෂ පාර්ශවයෙන් බවත් අධ්‍යයන තොරතුරු තුළින් නිගමනය කළ හැකි විය.

මත්ද්‍රව්‍ය භාවිතය හා ව්‍යාප්තිය අවම කිරීමට ශ්‍රී ලංකාව තුළ පවතින නීති පද්ධතිය ප්‍රමාණවත් වුවත්, අඩුපාඩු පවතින බැවින් ඒවා නිවැරදි කොට ක්‍රියාත්මක කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට දණ්ඩන ලබාදෙන නෛතික රාමුව දැඩි කිරීම මෙන්ම, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පවතින ඉඩකඩ පූර්ණ ලෙස අහෝසි කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණය හා පුද්ගල චර්යා පිලිබඳ වැඩමුළු මගින් සමාජය දැනුවත් කිරීම මෙහි ලා නිර්දේශිත වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Bureau, S. L. (2017). T*rends related to the usage of Nacotic and Psychotropic dangerious drugs and related trends* , Retrieved on 21st December, 2022, from https://www.nddcb.gov.lk

Elflein, J. (2021). Global Drug Use- Statistics and Facts: Retrieved on 17th January, 2022 from https://www.who.int

Lewis. (2016). *factors influence drug abuse*: Retrieved on 17th February, 2022 from https://www.livestrong.com

NDDCB- National Dangerous Drugs Control Board. (2021). *Annual Report.* Retrieved on 15th January, 2022, from https:// www.nddcb. gov.lk

NDDCB- National Dangerous Drugs Control Board, (2019). *National Prevalence Survey on Drugs Use* Retrieved on 21st December, 2022, from https://www.nddcb.gov.lk

NDDCB- National Dangerous Drugs Control Board. (2016). *Annual Report.* Retrieved on 15th January, 2022, from https:// www.nddcb .gov.lk

UNODC- United Nations Office on Drugs and Crimes. (2021). *World Drug Report*. Retrieved on 21st January, 2022 from https:// www. unodc.org